# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2424/52 - 2025 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2025.02.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

### 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත

2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගවල 5 වන නියෝගය යටතේ වන නියමය

2012 මැයි මස 15 වන දින අංක 1758/19 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගවල කාර්යය සඳහා පත්කරන ලද නිසි බලධරයා වන හැඩිගලගේ සම්පත් සජීව තුයියකොන්තා වන මම, ඉහත කී නියෝගවල 5 වන නියෝගය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, මේ නියමය මගින්, කලින් කලට සංශෝධිත සහ 2025 පෙබරවාරි මස 20 වැනි දින අංක 2424/51 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ලැයිස්තුවට කරන ලද සංශෝධනය මගින් අවසන් වරට සංශෝධිත, ඉහත කී නියෝගවල 4 වන නියෝගය යටතේ නම් කර ඇති සහ ලැයිස්තුගත කර ඇති සහ 2014 මාර්තු මස 21 වැනි දින අංක 1854/41 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තකුට, කණ්ඩායමකට හෝ අස්ථිත්වයකට අයිතිව තිබෙන හෝ ඔවුන් සතු හෝ ඔවුන් විසින් දරනු ලබන සියලු අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් මේ නියමය මගින් ක්‍රියා විරහිත කරමි.

2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගවල 5 වන නියෝගය යටතේ සාදන ලද 2014 මැයි මස 22 වැනි දින අංක 1863/25 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය, ඒ යටතේ සිදු කරන ලද කිසිවෙකුට අගතියක් නොමැතිව මෙයින් අවලංගු කරනු ලැබේ.

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික),
ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී,
එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයන - චීනය),
එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන), කළමනාකරණ, එම්එස්සී,
(ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන), එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.
නිසි බලධරයා.

2025 පෙබරවාරි මස 20 වැනි දින.
කොළඹ දී ය.

EOG 02 - 0186